ජාතික ඉතිරිකිරීමේ බැංකුව  A/C No.

# NSB Pension + ගිණුම

**කොන්දේසි**

1. වයස අවුරුදු 16 ට වැඩි ඕනෑම ශ්‍රී ලාංකික පුරවැසියකුට මෙම ගිණුම් ක්‍රමයට ඇතුලත් වියහැකිය.

2. අනේවාසික ශ්‍රී ලාංකික පුරවැසියන්ට ද මෙම ගිණුම් ආරම්භ කළහැකි අතර, තැන්පතු බ්‍රිතාන්‍ය පවුම්, ඇමරිකන් ඩොලර් හෝ යූරෝ මුදල් වලින් සිදුකල යුතුය. ප්‍රතිලාභ ශ්‍රී ලංකා රුපියල් වටිනාකම මත තීරණය වන අතර, ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවනු ලැබේ.

3. ගිණුමක අවම ආරම්භක තැන්පතු මුදල රු.1000/- ක් වන අතර, ගිණුම් විවෘත කිරීමෙන් පසුව ඕනෑම අවස්ථාවක ඕනෑම මුදලක් තැන්පත් කළහැකිය. අවශ්‍ය නම් එකවර තැන්පතුවක් ලෙස හෝ කළහැකිය.

4. විශ්‍රාම වැටුප් ලැබීමට සාමාජිකයාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වියයුතුය. යම් සාමාජිකයකුට අවශ්‍ය නම් වයස අවුරුදු 55 න් පසුව ද විශ්‍රාම වැටුප් නොලබා විශ්‍රාම වැටුප් ලබා ගන්නා දිනය ඉදිරියට කල්දැමිය හැකි අතර, එසේ වයස අවු.60 දක්වා ප්‍රමාද කළහැකිය. එහිදී අවශ්‍ය නම් නව මුදල් තැන්පත් කරමින් ශේෂය වර්ධනය කළහැකිය.

5. විශ්‍රාම වැටුප් හිමිකම ලැබීම සඳහා තැන්පත්කරුවන්ගේ තැන්පත් කාලසීමාව අවසන් වනවිට අවම වශයෙන් රු.100,000/- ශේෂයක් ගිණුමේ පැවතිය යුතුය. නියමිත කාලසීමාව අවසාන වන විට ශේෂය රු.100,000/- අඩුනම් ගිණුමේ පවත්නා ශේෂය ආපසු ගෙවනු ඇත.

6. ගිණුම් හිමිකරුගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වන තෙක් මෙම ගිණුමේ මුදල් හෝ පොලිය ආපසු ගැනීමට නොහැකිය.
   I. එහෙත් විශේෂ හේතුවක් නිසා සාමාන්‍යාධිකාරීගේ අනුමැතිය මත ගිණුම පියවීමට ඉඩදෙනු ලැබේ.
   II. එසේ පියවීමකදී තැන්පතුව ආරම්භ කළ දින සිට වර්ෂ 03 දක්වා කිසිදු පොලියක් සඳහා හිමිකම් නොමැත.
   III. ගිණුම පියවීම සිදුවනුයේ ආරම්භ කළ දින සිට වර්ෂ 04 කට පසුව නම් එම 4 වන වර්ෂයේ සිට බැංකුවේ සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුම් වලට අදාළ පොලී අනුපාත හිමිවේ.
   IV. පොලියට අමතරව බැංකුව විසින් කරන ලද ප්‍රදානයන් (වෛද්‍ය වියදම ප්‍රතිපූරණය කිරීම , වෙනත් දිරි දීමනා) අඩුකර ඉතිරි මුදල පමණක් ආපසු ගෙවනු ලැබේ.
   V. ගිණුම පියවන අවස්ථාවේදී බැංකුවේ පවත්නා සාමාන්‍ය ඉතිරිකිරීම් සඳහා වන පොලී අනුපාතය මෙහිදී අදාල වනු ඇත.
   VI. ගිණුමේ ශේෂයෙන් කොටසක් පමණක් ආපසු ගැනීමට ඉඩදෙනු නොලැබේ.

7. විශ්‍රාම වැටුප් පහත සඳහන් පරිදි ලබාගත හැකිය
   (1) විශ්‍රාම වැටුප ජීවිතාන්තය දක්වා
   (11) කලින් තීරණය කළ නිශ්චිත කාලසීමාවක් සඳහා
   (111) එකවර මුළු මුදලම
   (1v) ඉහත සඳහන් ක්‍රම වල සම්මිශ්‍රණයක් ලෙස
   (v) ජීවිතාන්තය දක්වා විශ්‍රාම වැටුප් ලබා ගන්නා අවස්ථා වලදී ගෙවනු ලබන විශ්‍රාම වැටුප් ප්‍රමාණය එවකට බලපාන පොලී අනුපාතය මත මාස 06 කට වරක් සමාලෝචනය කරනු

ලබන අතර, එය තීරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන **බරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය (AWDR)** අනුවය.

(v) (අ) යම්කිසි අවස්ථාවක ශ්‍රී ලංකා මහ බැංකුව විසින් **බරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය** ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවුවහොත් එම අවස්ථාවේදී කළමනාකාරත්වය විසින් තීරණය කරන උචිත අනුපාතයක් මත පොලිය ගණනය කරනු ලැබේ.

(ආ) විශ්‍රාම වැටුප් ලබන අතරතුර සාමාජිකයා මියගියහොත් ගිණුමේ ශේෂය නාමයෝජිතයාට ගෙවනු ලැබේ.

(vi) නිශ්චිත කාලසීමාවකට විශ්‍රාම වැටුප් ලබා ගන්නා අයගේ එම නිශ්චිත කාලසීමාව අවසන් වූ පසුව ගිණුමේ ශේෂය ශූන්‍ය වන හෙයින්, ඒ අනුව එසේ කාලසීමාව අවසන් වූ පසුව කිසිදු මුදලක් ගෙවනු නොලැබේ.

(vii) විශ්‍රාම ලබා ගන්නා කාලය අවසන්වීමට ප්‍රථම සාමාජිකයා මිය ගියහොත් ගිණුමේ සම්පූර්ණ ශේෂය නාමයෝජිතයාට ගෙවනු ලැබේ.

8. විශ්‍රාම වැටුප් ප්‍රමාණය තැන්පත්කරුගේ තැන්පතු ශේෂය සහ එදිනට **බරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය** සහ විශ්‍රාම වැටුප් ලබා ගැනීමට අපේක්ෂිත කාලසීමාව අනුව තීරණය කරනු ඇත.

9. විශ්‍රාම වැටුප් ලබන අතරතුර විශ්‍රාම වැටුප් ලබා ගන්නා කාලසීමාව හෝ ලබාගන්නා ආකාරය එක්වරක් පමණක් සංශෝධනය කිරීමට අවසර දෙනු ලබන අතර, එහිදී මෙම ගිණුම් වලට අදාල පොලී අනුපාතය වයස 55 සම්පූර්ණ වන අවස්ථාවේ පැවැති පොලී අනුපාතය හෝ සංශෝධනයට ලක් කරන අවස්ථාවේදී ඇති **බරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය** (AWDR) හෝ යන දෙකින් අඩු පොලී අනුපාතය ඒ සඳහා අදාල වනු ඇත.

10. මෙම ගිණුම් වල රු.10,000/- ක් සහ රු.10,000/- න් සමානව බෙදෙන කොටසක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කළ **බරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය** ( AWDR) සහ ඒ මත බැංකුව විසින් තීරණය කරනු ලබන ආන්තික පොලී අනුපාතයක් එකතු කර පොලිය ගෙවනු ලැබේ. රු.10000/- ට අඩු සහ රු.10000/- න් නොබෙදෙන ඉතිරි කොටස් සඳහා බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුම් සඳහා වන පොලී අනුපාතය මත ආන්තිකයක් එකතු කොට පොලිය ගෙවනු ලැබේ. තැන්පතු සඳහා බැර කරන පොලී අනුපාතය සෑම මාස 06 කට වරක්ම ඉහත පරිදි සංශෝධනය කරන අතර, එම අනුපාතය සුදුසු පරිදි බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

11. ගිණුමේ ශේෂ මුදලක් තිබියදී තැන්පත්කරු මියගිය හොත් එම මුදල් ලැබීම සඳහා සෑම ගිනුම් හිමියෙකුම නාමයෝජිතයකු නම් කළයුතු අතර, මියගියහොත් ගිණුමේ ශේෂය එම නාමයෝජිතයාට හිමිවේ. එසේම ජීවිතාන්තය දක්වා විශ්‍රාම වැටුප් ලබා ගැනීමට කැමැත්ත පල කළ අයෙකු මියගිය පසුව විශ්‍රාම වැටුප් ගෙවීම අත්හිටුවන අතර, ගිණුමේ ශේෂය නාමයෝජිතයාට ගෙවනු ලැබේ. කෙසේ වුවද නාමයෝජිතයාට වෙනත් ප්‍රතිලාභ වලට හිමිකම් කිවනොහැකිය.

12. සේවා යෝජකයින් විසින් තම සේවකයින් වෙනුවෙන් මෙම ගිණුම් ක්‍රමයට මුදල් බැරකිරීමේදී එම ආයතනයේ සේවකයින්ට පිරිනමනු ලබන සමූහ පුද්ගලික ණය පහසුකම් වෙනුවෙන් සාමාන්‍ය පොලී අනුපාතයෙන් 1% ක වට්ටමක් ප්‍රදානය කරනු ලැබේ.(මෙම වට්ටම් දෙනු ලබන්නේ සේවා යෝජකයා විසින් දායකත්වය දක්වන තුරු පමණි.)

13. මෙම ගිනුම් හිමියන් විසින් බැංකුවෙන් ලබා ගන්නා ඕනෑම ණය මුදලක් වෙනුවෙන් බැංකුව විසින් අයකරනු ලබන සේවාගාස්තු වලින් 50% ක් දක්වා වට්ටම් දෙනු ලැබේ.

14. මෙම ගිණුමට අඛණ්ඩව ස්ථාවර මුදලක් මාසිකව තැන්පත් කරන සාමාජිකයන්ට නිශ්චල දේපල උකසට තබා දෙනු ලබන ණය සඳහා පහත සඳහන් සීමාවන් දක්වා වැටුප් විස්තර නොමැතිව ණය ලබාගැනීමට අවස්ථාව හිමිවේ.

| වසර 01 අඛණ්ඩව මාසිකව ගෙවූ අය | වසර 02 අඛණ්ඩව මාසිකව ගෙවූ අය | වසර 03 අඛණ්ඩව මාසිකව ගෙවූ අය | වසර 04 හෝ ඊට මාසිකව වැඩියෙන් මාසිකව අඛණ්ඩව ගෙවූ අය |
|---|---|---|---|
| ණය වාරිකය තැන්පත් වාරිකය මෙන් දෙගුණයක් දක්වා | ණය වාරිකය තැන්පත් වාරිකය මෙන් තුන් ගුණයක් දක්වා | ණය වාරිකය තැන්පත් වාරිකය මෙන් හතර ගුණයක් දක්වා | ණය වාරිකය තැන්පත් වාරිකය මෙන් පස් ගුණයක් දක්වා |

* මෙම ණය වාරිකය තීරණය කරනු ලබන්නේ අවුරුදු 10 කාලසීමාවක් පදනම් කරගෙනය.

15. මෙම ගිණුම් ක්‍රමයට ඇතුලත්වන ගිණුම්කරුවන්ට වෛද්‍ය වියදම් ප්‍රතිපූරණයක් හිමිවන අතර, එයට අදාල කොන්දේසි පහත සඳහන් වේ.

I. ගිණුම් හිමියන්ගේ වෛද්‍ය වියදම් පමණක් ප්‍රතිපූරණය කරනු ලැබේ.

II. වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කරනු ලබන්නේ සාමාජිකයාගේ වයස අවුරුදු 55 දක්වා පමණි.

III. මෙම පහසුකම් ලබාගැනීම සඳහා ගිණුම්කරුවකු රු.50,000/- ක් හෝ ඊට වැඩි මුදලක් දක්වා තැන්පත් කළයුතු අතර, එම මුදල සම්පූර්ණ වූ දින සිට වර්ෂයක කාලයක් ගත වියයුතුය.

IV. වෛද්‍ය ප්‍රතිලාභ මගින් ආවරණය කරනු ලබනුයේ පහත සඳහන් බරපතල රෝගාබාධ සඳහා දරණ වියදම් පමණි.

- හෘද සැත්කම් / ප්‍රතිකාර
- මොලයේ සැත්කම්/ ප්‍රතිකාර
- පිලිකා සඳහා සැත්කම්/ ප්‍රතිකාර
- සම්පූර්ණ අන්ධභාවය
- වකුගඩු බද්ධ කිරීම/ ප්‍රතිකාර

V. තම දැනීමේ ප්‍රමාණයට ඉහත දක්වා ඇති රෝගයකින් නොපෙලෙන බවට සාමාජිකයා විසින් ප්‍රකාශයක් කළයුතුය.

VI. යම් හෙයකින් සාමාජිකයා ගිණුම ආරම්භ කිරීමට පෙර එහි සඳහන් රෝගයකින් පෙළුන බව බැංකුවට දැනගැනීමට ලැබුණහොත් වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කරනු නොලැබේ.

VII. වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය මත කළ පසුව එසේ දැන සිටි බව බැංකුවට දැන ගැනීමට ලැබුණහොත් එම මුදල් සහ ඒ මස වු පොලිය ද ගිණුමේ ශේෂයෙන් හර කරනු ලැබේ

VIII. වෛද්‍ය ප්‍රතිපූරණය කරනු ලබන මුදල පහත සඳහන් පරිදි ගණනය කරනු ලැබේ.

| ගිණුම්කරුවකු විසින් තැන්පත් කර ඇති මුළු මුදල රු. | හිමිකම් ලබන මුදල රු. |
|---|---|
| 50,000/- | 100,000/- |
| 150,000/- | 200,000/- |
| 200,000/- | 300,000/- |
| 500,000/- | 750,000/- |
| 700,000/- හෝ ඊට වැඩි | 1,000,000/- |

IX. වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය සෑම වර්ෂ 05 කට එක් වරක් පමණක් ප්‍රතිපූරණය කළහැකිය. (ප්‍රතිපූරණය සඳහා හිමිකම් ලබන මුදල වසර 5 තුල අවස්ථා කීපයකදී ලබා ගත නොහැකිය.)

X. සියලු වෛද්‍ය වියදම් වෛද්‍ය බිල්පත් මගින් තහවුරු කළයුතුය.

XI. සියළු වෛද්‍ය ආදේශ මාස 06 ක් ඇතුලත ඉදිරිපත් කළයුතු අතර, මාස 06 කට පසුව ඉදිරිපත් කරනු ලබන ආදේශ වලට ගෙවීම් කරනු නොලැබේ.

XII. වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය සඳහා වැය වන මුදල විශ්‍රාම වැටුප් අරමුදලින් අඩු කරනු නොලැබේ.

XIII. වෛද්‍ය වියදම් ආදේශ 2 ක් අතර, අවම ලෙස මාස 24 ක පරතරයක් තිබියයුතුය.

XIV. ප්‍රතිපූරණ දිනය ලෙස සාමාජිකයා රෝහලින් පිටවී ගිය දිනය අදාල වේ. පූර්ණ අන්ධ භාවය සඳහා දිනය වශයෙන් සලකනු ලබන්නේ වෛද්‍ය වරයා විසින් ඒ බව සහතික කරන ලද දිනය වේ.

XV. රෝග පිළිබඳව වෛද්‍ය සභාව විසින් අනුමත කරන ලද රෝහලක වෛද්‍යවරයකු විසින් සහතික කළයුතුය.

16. ඉහත සඳහන් ඕනෑම කොන්දේසියක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි කළමනාකාරත්වය විසින් සංශෝධනය කිරීමකට භාජනය කළහැකිය.

මෙම කොන්දේසි පත්‍රයේ අඩංගු සියළු කරුණු මා විසින් කියවා තේරුම් ගත් බවත් මගේ දැනීමේ හැටියට ඉහත අංක 16 (v) වගන්ති වල සඳහන් කිසිදු රෝගයකින් මා නොපෙලෙන බවත් ඉහත සඳහන් කොන්දේසි හා නීතිරීති පිලිපැදීමට එකඟ වන බවත් මෙයින් සහතික කරමි.
තවද, මෙම කොන්දේසි ඇතුලත් ලියවිල්ලේ පිටපතක් මා ලබාගත් බව ද සහතික කරමි.

.

.................................................... .............................................

ගිණුම් හිමියාගේ අත්සන දිනය

නම............................................................

හැඳුණුම්පත් අංකය............................ බලයලත් නිලධාරී.............................

**නිර්වචන**

- AWDR - පසුගිය ලිත් මාස 06 සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද මාසික බර්ත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතයේ සාමාන්‍යය.
- Remittances in foreign currency - මේ සඳහා හුවමාරු අනුපාතය තීරණය වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පසුගිය ලිත් මාස 06 තුල ප්‍රකාශයට පත් කරන විදේශ මුදල් ඉතිරිකිරීමේ මිළදී ගැනීමේ මාසික අනුපාතයේ සාමාන්‍යයයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එසේ ප්‍රකාශයට පත් නොකලහොත් කළමනාකාරත්වය විසින් තීරණය කරන ලද උචිත අනුපාතයක් මත ගණනය කරනු ලැබේ.
- විදේශ මුදල් වලින් කරනු ලබන තැන්පතු සඳහා වන පොලිය සාමාන්‍ය විදේශ මුදල් ගිණුම් සඳහා වන පොලිය මත එකතු කල ආන්තිකයක් සහිතව ගෙවනු ලැබේ. එය ද මාස 6 කට වරක් සමාලෝචනය කෙරේ.

- මාස 06 ක කාල සීමාව සෑම වර්ෂයකම මාර්තු 15 සිට සැප්තැම්බර් 14 දක්වාත් , සැප්තැම්බර් 15 සිට මාර්තු 14 දක්වාත් වේ.

**තැන්පතු සහ ඉන් උත්පාදනය කරන සියළුම ඉපයීම් සඳහා රජයේ පූර්ණ ආරක්ෂාව හිමිවේ.**

**ගිණුම් හිමියන්ගේ දැන ගැනීම සඳහා**

1. වයස අවුරුදු 18 55 ත් අතර ඕනෑම ශ්‍රී ලාංකිකයකුට රු.1,000/- ක් හෝ ඊට වැඩි ඕනෑම මුදලක් මගින් ආරම්භ කළහැකි අතර, ඉන්පසු ඕනෑම මුදලක් ඕනෑම අවස්ථාවක තැන්පතු කළහැකිය.

2. තැන්පත්කරුට වයස අවුරුදු 55 සම්පූර්ණ වනතුරු මෙම ගිණුමේ මුදල් ආපසු ගැනීමට අවසර දෙනු නොලැබේ.

3. ජා.ඉ.බැ ඕණෑම ශාඛාවකින් හෝ ඕනෑම තැපැල් කාර්යාලයකින් හෝ ඕනෑම NSB ATM යන්ත්‍රයකින් හෝ මෙම ගිණුමට මුදල් තැන්පත් කළහැකිය.

4. ගිනුමට බැර කිරීම සඳහා චෙක්පත් භාරගනු ලැබේ.

5. ගිණුමේ පොලී අනුපාතය සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිනුම්වල පොලී අනුපාත්යට වඩා වැඩිය.

6. පරිගණක ශාඛාවල ගිණුම් වෙනුවෙන් ගෙවියයුතු පොලිය මාසිකව ගණනය කර වර්ෂය අවසානයේදී බැර කරනු ලැබේ.

7. මෙම පාස්පොත පරික්ෂාකාරිව තබාගන්න. මෙය නැතිවුවහොත් ඒ බව නොපමාව අදාළ කාර්යාලයට දැනුම් දෙන්න.

8. ඔබේ ලිපිනය හෝ නම ( විවාහයෙන් පසු නම වෙනස්වීමක් ද ඇතුළුව) වෙනස් කරනු ලැබුවහොත් ඒ බව වහාම බැංකුවට දැනුම්දීමට කටයුතු කරන්න.